සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| දෙවන වාර පරීක්ෂණය 2018<br>இரண்டாம் தவணைப் பரீட்சை 2018<br>Second Term Test 2018 | 11 ශ්‍රේණිය<br>தரம 11<br>Grade 11 |
| සිංහල භාෂාව හා සාහිත්‍යය 11<br>Sinhala Language And Literature 11 | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two Hour |

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

1. i සිට x තෙක් ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ දෙක නම් කරන්න.
(අ) ඞ,ඤ, ණ, න, ම (ආ) ත, ථ, ද, ධ, න

ii පහත සදහන් වාක්‍යයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.
ප්‍රසිද්ධ ගායක ගායිකාවන් රැසක් සහභාගි වූ සංගීත සංදර්ශණය කලට වේලාවට ආරම්භ නොවූ හෙයින් නිම කිරීමට සිදු වූයේ අළුයම පහට පමණ ය.

iii පහත සදහන් පද දෙක විසන්ධි කොට ලියන්න.
(අ) ඇද්දල (ආ) මෙහෙසුරු

iv. පහත සදහන් පද දෙක කවර සමාසවලට අයත්දැයි නම් කරන්න.
(අ) අඹුදරු (ආ) මදපවන්

v. පහත දැක්වෙන කර්තෘකාරක වාක්‍ය දෙක කර්මකාරකයට හරවා ලියන්න.
(අ) වෛද්‍යවරු රෝගීන් සුවපත් කරති.
(ආ) ආදි ශිෂ්‍යයෝ අප පිළිගත්හ.

vi. පහත දැක්වෙන (අ) ,(ආ) යෙදුම්වල පළමු වචනය සමග දෙවන වචනයේ නොගැළපීමක් ඇත. වඩා ගැළපෙන සේ පළමු හෝ දෙවන පවචනය සකස් කර ලියන්න.
(අ) විදෙස් ප්‍රවෘත්ති (ආ) වර්ෂා කල

vii. පහත සඳහන් වාක්‍ය දෙකෙහි තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.
(අ) වැව් **පිරුණොත්** කෙත්වතු සරු වේවි.
(ආ) අම්මා බෙහෙත් **බී** නින්දට ගියා ය.

viii පහත සඳහන් වාක්‍ය දෙකෙහි සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.
(අ) සොරු කැලෑවේ සැඟවී සිටිති'යි පොලීසිය සැක කරයි.
(ආ) ලේඛකයෙක් වූ ඔහු දක්ෂ ගායකයෙක්ද විය.

ix. හිසකේ රැවුල් කපන්නා හැඳින්වීමට යොදන තනි පදය කරනැවැමියා නම්
(අ) උපසම්පදා නොවූ භික්ෂුව.
(ආ) සමාන හදවතක් ඇත්තා.

x. ධීවර කර්මාන්තය හා බැඳී ඇති පහත සඳහන් පදවල අදහස ලියන්න.
(අ) මාරියාව
(ආ) ඉහත්තුව

2. පහත දැක්වෙන අ, ආ, ඉ, ඊ යන විස්තර අතුරින් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු රචනයක් ලියන්න

(අ) සන්නිවේදන මාධ්‍යයන්ගේ වර්ධනයත් සමග මුළු ලෝකයම විශ්ව ග්‍රාමයක් බවට පත්වන ලකුණු දැන් දැන් පහළ වෙමින් පවතී. මෙහිදී රූපවාහිනිය ආදී කොටගෙන ඇති විද්‍යුත් මාධ්‍යයන්ගේ බලපෑම අති

විශාලය.ජනතාව ක තුළ දැනුම , වින්දනය හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සියලු සන්නිවේදන මාධ්‍යයන්ගේ වගකීමකි එය ජාතික කර්තව්‍යයකි.

(ආ) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ වගකීමට ලොව සෑම රටක්ම බැඳී සිටියද ළමයින් මෙහෙකරු සේවයේ යෙදවීම ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල පවතින පලබල සමාජ ගැටලුවකි. ළමා ශ්‍රමිකයන් මෙවැනි විවිධ අපයෝජනවලට ලක් වීම හා ඔවුන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳ පුවත් නිතර වාර්තා වේ. නොයෙක් සමාජ ආර්ථික හේතු මත උද්ගත වී ඇති මේ ප්‍රශ්නය විසඳීමට ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

(ඉ) වර්තමාන ශ්‍රී ලාංකිකයන් වැඩි දෙනෙකුගේ සමීපතම රූපවාහිනී වැඩසටහන බවට පත්ව තිබෙන්නේ ටෙලි නාට්‍යයි. මේවායින් බහුතරයක් කලාත්මක බවින් හීන හරසුන් ඒවා බව විචාරකයෝ පවසති. එබැවින් ටෙලි නාට්‍ය අධ්‍යාපනික, සෞන්දර්යාත්මක හා ගුණාත්මක අරමුණු සමග සබැඳි විනෝදාස්වාදාත්මක මාධ්‍යයක් බවට පත් කිරීම කාලීන අවශ්‍යතාවකි.

(ඊ) ගැමි පරිසරය සමග බැඳුණු සිංහල සංස්කෘතිය හා සාරධර්ම ශ්‍රී ලාංකේය අනන්‍යතාව කදිමට කියාපායි සංවර්ධන ඉලක්ක කරා යාමේදී සිදුවන නාගරීකරණය නිසා මෙම උසස් ගුණාංග ක්‍රමයෙන් අභාවයට යමින් පවතී. මේවා ආරක්ෂා කර ගැනීමට පෙළ ගැසීම අප කාගේත් වගකීමකි.

3. පහත දැක්වෙන පාඨය වචන 55-65 අතර සංඛ්‍යාවකින් සාරාංශ කොට ලියන්න ඔබේ සාරාංයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න

දරුවා යනු රටක ජාතික සම්පතකි. එම සම්පත රටට ඵලදායී ලෙස සකසා ගැනීමේ වලකීම දරුවාගේ මව්පියන් අත රැඳී පවතී. දරුවකුගේ පූර්ණ සංවර්ධනය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කළ යුතු වේ. ළමයාගේ මානසික සංවර්ධනයට බලපාන ප්‍රධාන හේතු සාධක ලෙස අධ්‍යාපනය දැක්විය හැකිය. දරුවකු අධ්‍යාපනය ලැබිම අරඹනු ලබන්නේ මවුකුස තුළදීමය. මවුකුසින් බිහි වූ දරුවකුගේ දිවියේ මුල් වසර පහ සම්පූර්ණ වන විට මොළයේ වර්ධනයෙන් සියයට 90 වක් සම්පූණ වී අවසන් ය. මොළයේ ශීඝ්‍ර වර්ධනයක් සිදුවන මුල් වසර පහ තුළ ඊට රුකුල් ලබා දීම මව්පිය වැඩිහිටි සැමගේ වගකීමකි. ඒ සඳහා අවශ්‍ය විවිධ ඉගෙනුම් අවස්ථා නිවසේ දීම සළසා දීම කළ හැකි ය.නිවස ආශ්‍රිතව කෙරෙන සෑම ක්‍රියාකාරකමක් ආශ්‍රයෙන්ම දරුවාට අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව සලසාදීමට හැකියාව තිබේ.නිවසේ කටයුතු සඳහා දරුවා හවුල් කර ගැනීම තුළින් දරුවාගේ සංවර්ධනයට අවශ්‍ය සාධක සලසාදීමට මවුපියන් ක්‍රියා කළ යුතුවේ.දරුවා නිවසින් පෙර පාසලටද පෙර පාසලින් විධිමත් අධ්‍යාපනයටද යොමු වීමේදී නිවසේදී ලබාගන්නා අත්දැකීම් හා දැනුම ඔවුන්ට උපකාරී වේ.

4. පහත දැක්වෙන කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

ලංකාවේ ගද්‍ය හා පද්‍ය සාහිත්‍ය කලාවන් අනුරාධපුර යුගයේ සිටම නිශ්චිතව දෘශ්‍යමාන වන නමුත් නාට්‍ය කලාව පිළිබඳ එවැනි තත්ත්වයක් ඇති නොවීය. එසේ වුවද විජයාවතරණයේ සිට යක් නැටුම් විශේෂයක් පැවති බවටද පණ්ඩුකාභය රජතුමා පවා නෘත්‍ය,ගීත,වාද්‍ය, මගින් ප්‍රීතිමත් වූ බවද මහාවංශයේ සඳහන් වී තිබේ. පොළොන්නරු යුගයේ පැරකුම්බා රජු විසින් කරන ලදැයි පිළිගැනෙන "සරස්වතී මණ්ඩපය"ද රාජකීය නෘත්‍ය ශාලාවක් ලෙස විචාරකයෝ අදහස් කරති.අනුරාධපුර යුගයේ සිට මෙහි වැසියෝ ලෞකික ජීවිතයේ විවිධාකාර ගැටලුවලට මුහුණ දුන්හ. ඔවුන් ත්‍රිවිධ රත්නයට අමතරව විවිධ දෙවි දේවතාවුන් හා යක්ෂ, භූත , ප්‍රේත, වැනි ප්‍රාථමික ඇදහිලි හා පූජා විදිවල නිරත වී ඇත. මෙම ඉපැරණි පූජා විදි හා ඇදහිලිවල නාට්‍යමය ලක්ෂණ ඇතුළත් වී තිබිණි ලෝකයේ වෙනත් රටවල මෙන්ම ලක්දිව ද නාට්‍ය කලාවේ උපත සෙවිය යුත්තේ ලාංකික ආගමේ වන්දනාමාන,පූජෝත්සව, හා යාගහෝම ආදියෙහි යයි සිතීම යුක්ති යුක්ත බව සිංහල ගැමි නාටකය නම් කෘතිය මඟින් එදිරිවීර සරත්චන්ද්‍ර ශූරීහු පෙන්වා දෙති.

(i) මෙම ඡේදයෙන් ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන ප්‍රධාන අදහස කුමක් ද?.
(ii) නාට්‍ය කලාව පිළිබඳ මහාවංශයේ සඳහන් කරුණු මොනවා ද?.
(iii) අනුරාධපුර යුගයේ වැසියන්ගේ ඇදහිලි ක්‍රම මොනවා ද?.
(iv) සරස්වතී මණ්ඩපය පිළිබඳ විචාරක මතය කුමක් ද?
(v) ලංකාවේ ගද්‍ය පද්‍ය කලාව ආරම්භ වූයේ කුමණ යුගයේ ද?.

5. "ග්‍රාමීය පෙදෙස්වල වගා නොකරන ලද ඉඩම්වල ගොවි මහතුන් සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ඒවායේ බෝග වගාව සඳහා ආධාර හා උපදෙස් සපයයි"
මෙය කොළඹ 02, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් පළකළ පුවත්පත් දැන්වීමක

කොටසකි.අංක 23/4, කලවාන පාර, ගොඩකවෙල. තරුණ සංගමයේ ලේකම් සමන් විජේතුංග ඔබ යැයි සිතා කොළඹ 02, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ආධාර හා උපදෙස් ඉල්ලමින් ලිපියක් ලියන්න.

නැතහොත්

ඔබ විද්‍යාලයේ ශිෂ්‍ය නායකයන්ට නිළ ලාංඡන පැළඳවීමේ උත්සවය උත්කර්ෂවත් අයුරින් පැවැත්වීට සියලු කටයුතු සූදානම් කොට ඇත. මෙහිදී ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන වැඩසටහන පිළිබඳ න්‍යාය පත්‍රයක් පිළියෙල කළ යුතුව ඇත. මෙහි සංවිධායක ඔබ යැයි සිතා උත්සවයෙහි සෑම අංගයක්ම ඇතුළත් කොට කාල කළමනාකරණය කෙරෙහිද සැලකිලිමත් වෙමින් අදාළ න්‍යාය පත්‍රය සකස් කරන්න.